**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 සහ 2023 වර්ෂ තුළදී ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබාදුන් ගුවන් යානා ඉන්ධන ලීටර් 202,000 කින් වටිනාකම රු.28,727,120 ක් වූ ඉන්ධන ලීටර් 77,000 ක් 2022 වර්ෂයේදී ලැබී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන ලීටර් 202,000 හි මුළු වටිනාකම වූ රු.67,320,620 ම වැය විෂය 224-1-1-1202-3 යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ ඉන්ධන වියදම රු.28,727,120 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ හා 2023 වර්ෂයේදී ඕස්ට්‍රේලියානු රජය මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ B - 200 ගුවන්යානාව පැදවීම සඳහා ලබාදුන් ඉන්ධන ලීටර් 202,000 ක ප්‍රමාණයක් විදේශ ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබුණු අතර 2023 වර්ෂයේදී එම ලද ඉන්ධන ලීටර් 202,000 ට අදාළව රු. 67,320,620 ක් ගිණුම්ගත කිරීම සිදු කරන ලදී. | ඉකුත් වර්ෂයේ විදේශ ප්‍රධාන යටතේ ලද ඉන්ධන එම වර්ෂයේ වියදමක් සේ ගිණුම්ගත කළ යුතු බව. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම හා ලේඛණගත කිරීම සඳහා නිවැරදි පද්ධතියක් ස්ථාපිතව නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ දෙකක ආරම්භක ශේෂයට ඉකුත් වර්ෂ වලදී අත්හැරී තිබූ මූල්‍ය නොවන වත්කම් රු.5,806,436,807 ක වටිනාකමක් එකතු කර තිබුණි. එම වටිනාකම තුළ 1985 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා ගිණුම්ගත වීම අත්හැරී තිබූ ගුවන් යානා 08 ක එකතු වටිනාකම රු.1,492,897,135 ක් ද ඇතුළත් වී තිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව විශාල වත්කම් ප්‍රමාණයක් පවතින බැවින්ද එම වත්කම් එකවර ගිණුම්ගත කිරීම අපහසු කාර්යයක් වන බැවින්ද, එයට විශාල කාලයක් අවශ්‍ය වන බැවින් ඉකුත් වර්ෂයන් තුන තුළ වරින් වර ඇතුළත් කර නොමැති ස්ථාවර වත්කම් හඳුනාගනිමින් ඒවා ඇතුළත් කර ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 මැයි 31 ඉදිකිරීම් පිරිවැය රු.6,904,872,231 ක් වූ අකුරේගොඩ පිහිටි නව ගුවන් හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල හා ඉඩම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් ගිණුම්ගත කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | 2023 මැයි 31 දින වන විට ගුවන් හමුදා මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය රු. 6,904,872,231 ක් ලෙස දක්වා ඇතත් පිරිවැය මුළුමනින් ගණනය කිරීමෙන් අනතුරුව අදාළ පිරිවැය වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. | ඉඩම හා ගොඩනැගිල්ලේ පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඒ.සී.ඒ.6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළින් ගිලන් රථ 04 ක්, ගිනි නිවීම් රථ 14 ක් , සංඥා රථ (**Radar Vehicle** ) 03 ක් , ජීප් රථයක් ,ට්‍රක් රථයක් හා **GPU** රථයක් ගිණුම් ගත කිරීම අත්හැරි තිබුණි. | මෙම වාහන පරිත්‍යාගයන් වන අතර ඒවායේ තක්සේරු කටයුතු සිදුකරමින් පවතී. | වර්ෂයට අදාළ නිවැරදි මූල්‍ය නොවන වත්කම් වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් ශීර්ෂ 20-03-02-16 ගුවන් යානා කුලී ආදායම් ඉපයීම අනුව, 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික ශුද්ධ ආදායම් ඉපැයීම් අඩුවීමේ ප්‍රවනතාවයක් පැවතුණි. එය 2016-2023 කාල පරිච්ඡේය තුල සියයට 24 සිට සියයට 94 ක් දක්වා වූ පරාසයක අවාසිදායක ලෙස විචලනය වී පැවතුණි. | ගුවන්යානා කුලී ආදායම් අවකරණයට හේතු ලෙස වාණිජ ගුවන් මෙහෙයුම් සඳහා භාවිත ගුවන් යානා සීමා වීම, නීතිමය ගැටලු, කොවිඩ් 19 වසංගත තත්වය, 2022 හා 2023 වර්ෂ වල පැවති ආර්ථික අර්බුදය දැක්විය හැකිය. | එම ආදායම් අය කර ගැනීමට කාලීන හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව, ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනිම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන | මෙම හිඟ හිටි ආදායම් කපා හැරීමට අනුමැතිය ඉල්ලා කැබිනට් සංදේශ යොමු කිරීමට තීරණය කර ඇත. | ආදායම් ගණන් දීමේ නිලධාරී විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | 02 කින් ගුවන් යානා කුලී ආදායම් එකතුව රු.12,674,073 ක් වර්ෂ 05 ත් 20 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පැවතුණි. | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව ,රජයේ ආදායම් පිළිබද ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය තැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව කලින් කල වරිපනම් හා අයකිරීම් හෝ බදු හා ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වුවත් 2016 වර්ෂයෙන් පසු ගුවන් යානා ගොඩබෑමේ ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි .ඒ අනුව ගුවන්යානා ගොඩබෑමේ ගාස්තුව රු.120.75 ලෙස ඉතා අවම මුදලක් වූ අතර ගුවන් යානා ගොඩබෑමේ වාර 2009 ක් වෙනුවෙන් ලද ආදායම රු.236,221 ක ඉතා පහළ අගයක් විය. | අදාළ ගාස්තු සංශෝධන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර ගාස්තු සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති බව දන්වා ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව ,රජයේ ආදායම් පිළිබද ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය තැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව ගාස්තු ආදී අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ඒකල ගුවන් හමුදා කඳවුර තුල ගොඩනැගිලි 05 ක් බදු දීම සඳහා රජයේ අදායමට ගැනීමට එක් ගිවිසුමක් හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලකට ආදායම් ලබා ගැනීමට තවත් ගිවිසුමක් ලෙස එකම ගොඩනැගිල්ලට ගිවිසුම් දෙකක් වශයෙන් ගිවිසුම් 10 ක් අත්සන් කර බදු කුලී අය කිරීම හේතුවෙන් එකතුව රු.2,037,400 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි | රජයේ පාර්ශවය වෙත ලැබෙන කුලී ආදායම රජයේ ගිණුම වෙත බැර කර සේවා ආයතන අරමුදල වෙනුවෙන් ලැබෙන කුලී ආදායම් මඟින් සුබසාධන කටයුතු, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදුකරයි. | රජයේ ගොඩනැගිලි උපයෝජනයෙන් ලබන ඉපයීම් රජයේ ආදායමට බැරවිය යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ අධ්‍යයනය , පුහුණුව, සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා විදේශගතවීමේදී අදාල කර ගත යුතු අංක MF/06/23/50/2023 දරණ සහ 2023 මාර්තු 20 දිනැති මුදල් අමාත්‍යාංශයේ නව චක්‍රලේඛයේ02(1) ඡේදය අනුව එක් දිනකට ඇ.එ.ජ.ඩොලර් 40 ක්ව පැවති අනියම් දීමනාව ඇ.එ.ජ. ඩොලර් 25 දක්වා අඩුකර උපරිම දින 15 ලෙස සංශෝධනය කර තිබුණු නමුත් එම නියමයෙන් බැහැරව 2023 මාර්තු 20 දිනෙන් පසුවද විදේශ අධ්‍යයන පුහුණු සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ නිලධාරීන් දස දෙනෙකුට දිනකට ඇ.එ.ජ ඩොලර් 40 බැගින් ගෙවීම් කර තිබුණි.ඒ අනුව විදේශ ගමන් වියදම් වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් 6045 ක් එනම් රු.2,006,109 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. | නව චක්‍රලේඛය ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රිවිධ හමුදාවන් වෙත 2023 මැයි 03 දින යොමු කර ඇති අතර එම චක්‍රලේඛයේ සංශෝධනයන් 2023 මාර්තු 20 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනයට උපදෙස් ලබාදී තිබේ.ඒ අනුව ශ්‍රීලංගුහ/255/1/ගිණුම් දරණ 2024 අප්‍රේල් 25 ලිපිය මගින් 2023 මාර්තු 20 සිට මැයි 03 දක්වා කාලය තුල ගුවන් හමුදා නිළධාරීන්ට එම අනියම් දීමනා ගෙවීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නිළ ඇඳුම් මිළදී ගැනීම මෙන්ම වාහන අළුත්වැඩියා දැඩි අවශ්‍යතාවයක් පැවතියදීත් අදාළ වාර්ෂික ප්‍රතිපාදන 2023 නොවැම්බර් 30 දින වන විටත් වැය නොකර ඌන උපයෝජනය වීම හේතුවෙන් රු.3,064,000,000 ක පුනරාවර්තන ප්‍රතිපාදන සහ යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ වැය විෂය මගින් රු.5,491,127,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන අවුරා තබා ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් ලබාදී තිබුණි. | වාර්ෂික ටෙන්ඩර් කාලය දීර්ඝ කිරීම් නිර්දේශ නොකිරීම, භාණ්ඩ ආනයනය සීමා කිරීම, භාණ්ඩ වල මිල අධික වීම, පුනරාවර්තන වියදමෙන් සියයට 6 ක මුදලක් අවුරා තැබීම,සේවයේ යෙදී සිටි සක්‍රීය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු පිළියෙල කරන අතර විවිධ හේතුන් මත සේවයෙන් ඉවත් කිරීම් හා විශ්‍රාම යාම් වැනි කරුණු නිසා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කළ නොහැකි වීම,MA -60 ගුවන් යානා සිවිල් මෙහෙයුම් පියාසර කිරීමට අනුමැතිය නොමැති වීම හේතුවෙන් ඒ සඳහා රක්ෂණ ආවරණය ලබා නොගැනීම ආදී හේතුන් නිසාවෙන් ප්‍රතිපාදන වැය නොවී පැවතුණි. | වාර්ෂික ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළයුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම් වලට එළඹීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයක් වෙනුවෙන් වාර්ෂිකව දරණ ලද බැදීම් හා බැරකම් වල එකතුව කිසිදු අවස්ථාවක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් එම නියමයෙන් බැහැරව 2023 වර්ෂයේදී වැය විෂය අංක 224-1-1-1401 - ප්‍රවාහන යටතේ රු.1,765,607 ක් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී තිබුණි. | 1401 ප්‍රවාහන යටතේ ශුද්ධ ප්‍රතිපාදන රු.570,000,000 ක් වේ. ACA-2 (iii) ආකෘතියේ සම්පූර්ණ වියදම වශයෙන් 557,850,607 ක් වේ.ඒ අනුව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව දරණ ලද බැදීම් හා බැරකම් වල එකතුව මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්ම විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගෙවිය යුතු සියළු බැරකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම iii - බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කල යුතු වුවත්, අවස්ථා 28 කට අදාල රු.20,121,111 ක් වටිනා බැරකම් සමාලෝචිත වර්ෂයේදී ඊට ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ප්‍රකාශයට ඇතුළත් නොවූ අවස්ථා 10 කට අදාළ එකතු වටිනාකම රු.12,619,050 ක් වූ බැරකම් වෙනුවෙන් 2023 වර්ෂයේ දී ගෙවා තිබුණි. | පිළිගත හැකි පිළිතුරක් ඉදිරිපත් වී නොමැත. | බැරකම් නිවැරදිව ලේඛණගත කල යුතු වීම. |

## 2.4 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන් දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i)ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 1 සහ 2 | 2,360,680 | රජයේ වැටුප් ලබන නිලධාරියෙකු රාජ්‍ය සේවයේ වෙනත් තනතුරකට මුදාහැරිය හැකි වුවත් ඉන් බැහැර වෙනත් වූ රජයේ නොවන බාහිර ආයතනයන්හි කටයුතු වෙනුවෙන් යෙදවිය නොහැකි වුවද එම නියමයන්ගෙන් බැහැරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයන් සිව් | (අ) මේවන විට මෙම ගුවන් භටයින් සිව්දෙනා ගුවන් හමුදා මූලස්ථානය වෙත වාර්තා කර ඇත.<br><br>(ආ) සේවා පුද්ගලයින් ගුවන් හමුදාව වෙත පැවරෙන විශේෂ රාජකාරි | නිලධාරීන් සේවයේ යෙදවීමේදී නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙනෙකු රාජ්‍ය සේවයෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත මුදාහැර 2023 මාර්තු 01 දින සිට 2023 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු.2,360,680 ක් වූ වැටුප් රජයෙන් ගෙවා තිබුණි.එසේම කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් භටයින් 31 ක් දින 01 සිට මාස 03 දක්වා වූ කාලයක් තම නිත්‍ය රාජකාරියෙන් බැහැරව වෙනත් බාහිර ආයතනයන්හි කටයුතු වලට යොදවා තිබුණි. | සහ සමාජ සත්කාර කටයුතු සඳහා අනුයුක්ත කර ඇති බව දන්වා තිබුණි. | |
| (ii) මු.රෙ. 128(1) (ආ) | 15, 303,304 | දෙපාර්තමේන්තු මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට හා අවශ්‍ය අවස්ථා වලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා ඒවා ක්‍රමානුකූලව සම්පූර්ණයෙන්ද අප්‍රමාදව එකතු කර ගැනීම සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද ගණන් දීමේ නිලධාරී, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයා වෙත වගකීමට බැඳේ.එසේ වුවද එම නියමයෙන් බැහැරව කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි ඇති රජයේ මානව හා භෞතික වත්කම් උපයෝජනයෙන් මෙහෙයවනු ලබන ආදායම් ප්‍රභවයන් 24 කින් උපයන ලද රු.15, 303,304 ක් රජයේ ගිණුමට බැර නොකර සේවා ආයතන අරමුදල සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වෙත බැර කිරීම හේතුවෙන් රජයට එම ආදායම් අහිමි වී තිබුණි. | මෙම ව්‍යාපෘතින් මඟින් සුබ සාධන කටයුතු සිදුකරනු ලබන අතර 2023 වර්ෂයේ රු. 10,313,775.00 ක මුදලක් මෙම අදායමින් රජයට ලබාදීම, ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම. මේ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසීම පිළිබඳ සාකච්ඡා සිදුවෙමින් පවතින බව දන්වා ඇත. | රජයේ මානව හා භෞතික සම්පත් උපයෝජනයෙන් ලබන ඉපයීම් රජයේ ආදායමට බැරවිය යුතු වීම. |
| (iii)මු.රෙ.2.(1) (ඇ) | 1,383,125 | රජය සතු සියළුම ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවත් එයින් බැහැරව මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරඟ සඳහා පුහුණු වීමට කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙහි ගුවන් පථය ලබාදීම වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂයේ රු.1,383,125 ක් ගුවන් හමුදාව විසින් උපයාගෙන ඒකාබද්ධ අරමුදලට බැර නොකර | මෙම ගුවන් පථය නඩත්තු කිරීම සේවා ආයතන අරමුදල හරහා සිදු වේ. මේ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසීම පිළිබඳ සාකච්ඡා සිදුවෙමින් පවතින බව දන්වා ඇත. | රජයේ මානව හා භෞතික සම්පත් උපයෝජනයෙන් ලබන ඉපයීම් රජයේ ආදායමට බැරවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යවස්ථාපිත නොවූ අරමුදලක් වන සේවා ආයතන අරමුදල වෙත බැර කර තිබුණි. | | |
| (iv) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය/මියගිය/සේවය අවසන් වන නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථාවලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැර වීම නිසා මියගිය/විශ්‍රාම ගිය/වැඩ තහනම් කරන ලද /සේවය හැරගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟහිටි ණය ශේෂය රු.10,759,840 ක් විය. ඒ අතරින් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.7,734,231 ක් විය. | විශ්‍රම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂය 2024.04.30 දින වන විට රු.160,476.52ක් දක්වා අඩු කිරීමට කටයුතු කර ඇති අතර සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂයෙන් රු.455,126.69 ක මුදලක් අත්හැර දැමීම සඳහා ලද නිර්දේශ අනුව අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි. | හිඟහිටි ණය අයකර ගැනීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |

**2.5 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2023 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් මාස තුනට අදාලව නිලධාරීන් 100 කගේ නියැදියකින් රු.2,875,270 ක් වූ අය විය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) වෙනුවට රු.482,770 ක් පමණක් අයකරගෙන තිබුණි.ඒ අනුව නව දේශීය ආදායම් පනතට අනුව සේවා නියුක්තික ආදායම නිවැරදිව හඳුනා නොගැනීමෙන් රු.2,392,500 ක අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වටිනාකම රජයට අහිමි වී තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව නිකුත් කරන ලද SEC/2023/E/01 මාර්ගෝපදේශයේ උපදෙස් මාලාවේ ඡේද අංක 3 හි කරුණු අංක 4 මඟින් දක්වා ඇති ආකාරයේ සියළු සේවා පුද්ගලයින්ට පොදුවේ විශේෂ සැලකිල්ලක් නොදැක්වීමේ පදනම මත ලබා දෙන දීමනා ආදායම් ප්‍රභවයන් 10 යටතේ සැලකිල්ලට නොගෙන අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කර ඇත. | 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කල යුතු වීම. |

## 2.6 අවිධිමත් ගණුදෙනු

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් සහ ඉහල නිලධාරීන් රජයේ ආයතන වල වෙනත් තනතුරු වලට මුදා හැරීමේදී ඔවුන්ට වෙන්කල මාණ්ඩලික රථ ද අදාල ආයතන වෙත මුදා හැර තිබුණි.එවැනි නිලධාරීන් 29 ක් වෙනුවෙන් 2022 ජනවාරි 01 සිට 2022 සැප්තැම්බර් 30 දිනට ඉන්ධන ලීටර් 76,175 ක් සපයා තිබුණු අතර එම වාහන වෙනුවෙන් කුලිය රු. 10,800,000ක් ගෙවා තිබුණි.ඒ අනුව ගුවන් හමුදාවේ රාජකාරියෙන් පරිභාහිරව වෙනත් ආයතන වල රාජකාරී කටයුතු වෙනුවෙන් ගුවන් හමුදා වැය ශීර්ෂයෙන් රු.10,800,000 ක වියදම් දරා තිබුණි. | අදාළ ආයතන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන ආයතන වේ. එම නිසා එම නිළධාරීන්ට හිමි මාණ්ඩලික රථ ඇතුළු අනෙක් වරප්‍රසාද ලබා දී ඇති බව දන්වා තිබුණි. | ශීර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගත හැකි පරිදි ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | මාසිකව රු.50,000 ක කුලී පදනම මත ලබා ගත් වාහන සඳහා මුදල් ගෙවීමේදී වවුචර් සමග අමුණා තිබුණු ඉන්වොයිසි වල කුලිය ගෙවීමට අදාලව ගෙවීම් සිදුකල වාහනයේ අත්‍යවශ්‍ය සාධකයක් වූ ගුවන් වාහන අංකය හෝ සිවිල් වාහන අංකය යන දෙකම රහිතව වාහන 47 ක් වෙනුවෙන් එකතු වටිනාකම රු.21,150,000 ක් ගෙවා තිබුණි. | මේ පිළිබඳව ගෙවීම් සම්බන්ධ කරුණු ඇතුළත් කර බිල්පත් ඉදිරිපත් කිරීමට සැපයුම්කරුවන් දැනුවත් කර ඇත | ගෙවීම් වවුචරය හා ඊට අදාළ ලියවිලි වල නිවැරදි තොරතුරු ඇතුළත්ව ඇති බවට සනාථ කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වීම. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක මූලික කඳවුරේ පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගයේ ව්‍යාපෘතියක් වන මෙට්ට ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරනු ලබන මෙට්ට 1380 ක් 2021 සිට 2024 පෙබරවාරි 09 දින දක්වා කාලය තුල රු.6,915,000 කට ප්‍රමිති සහතිකයක් මෙන්ම නිශ්චිත වගකීම් කාලයක්ද රහිතව කෘෂි අරමුදල ව්‍යාපෘතියෙන් (AGRO FUND) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිලදී ගෙන තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදයෙහි ප්‍රසම්පාදනයට අදාළ ප්‍රධාන අරමුණ වන ගුණාත්මකභාවය යන අවශ්‍යතාවය සනාථ කර ගැනීමෙන් පසුව මිලදී ගැනීම් සිදු විය යුතු වුවත් එයින් බැහැර වී තිබුණි. | මෙහි ගුණාත්මක බව පරීක්ෂා කිරීම සඳහා වෙනම කමිටුවක්ද පත් කර ඇති අතර එම කමිටුව මගින් භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු තොගයට ගැනීම සිදු කරයි. | විධිමත් ප්‍රමිති සහතිකයක් සහ වගකීම් කාලයක් සහිතව භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වටිනාකම රු.1,785,000 ක් වූ මෙට්ට 300 ක් විධිමත්ව ප්‍රමිතිය පරීක්ෂා නොකර, ලේඛන වලට ඇතුළත් නොකර 2024 ජනවාරි 01 දින අකුරේගොඩ ගුවන් හමුදා මූලස්ථානයේ පැවති වැඩසටහනක් වෙනුවෙන් භාවිතා කර තිබුණු අතර ඒවා මිලදී ගැනීමට අදාල ඇණවුම ඊට පසු දිනක (2024 ජනවාරි 20 දිනැති අංක PD/L/BRK/23/10266 දරන ඇණවුම මගින්) නිකුත් කර තිබුණි. | හදිසි අවශ්‍යතාවයන් මත තත්ත්ව පරීක්ෂාවකින් තොරව 2023 දෙසැම්බර් මස 28 වන දිනැති සැපයුම් අධ්‍යක්ෂකයෙහි අනුමැතිය පරිදි සැපයුම් හා නඩත්තු ඩිපෝවෙහි ලැබීම් හා බෙදාහැරීම් අංශය මගින් මෙට්ට 300 භාරගත් අතර මෙම මෙට්ට 2024 ජනවාරි මස 01 වන දින අකුරේගොඩ ගුවන් හමුදා මූලස්ථානයේ පැවති පිරිත් වැඩසටහනෙහි ප්‍රයෝජනය සඳහා භාවිතා කර ඇතත්, මෙම මෙට්ට මුළු ප්‍රමාණය භාවිතයෙන් පසු 2024 පෙබරවාරි 13 දින වන විට | නිවැරදි තොග පාලනයක් පවත්වා ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | තත්ත්ව පරීක්ෂණයන්ගෙන් සමත්ව 2024 පෙබරවාරි 15 වන දින තොග ගබඩාවට ඇතුළත් කරගන්නා බව දන්වා තිබුණි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා පෞද්ගලික ආයතනයක් සමඟ රු.9,675,750 ක (වැට් රහිත) ගිවිසුම්ගත මුදලකට ඩිෆෙන්ඩර් රථ 03 ක් අළුත්වැඩියාව වෙනුවෙන් 2021 පෙබරවාරි 06 දින ගිවිසුම් ගත වී ඇතත් ඒවායේ අළුත්වැඩියාව දින 673 ක් බැගින් වූ කාල ප්‍රමාදයකින් යුතුව සිදු නොකර ආපසු භාර දී තිබුණි. අදාළ ප්‍රසම්පාදනය ගුවන් හමුදාව අවලංගු කර තිබුණි. ප්‍රසම්පාදනයට අදාළව තාක්ෂණික ඇගයීම පරික්ෂාවේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1. (අ) IV ප්‍රකාර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ හා පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව ක්‍රියා කරන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තනි තනිව හා කමිටුව වගකිව යුතු වුවත්, එයින් බැහැරව අභ්‍යන්තර විගණන වාර්තාවක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන ප්‍රදානය සිදු කර තිබුණි.ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි වගකීමෙන් බැහැරවීම මත අදාළ ප්‍රසම්පාදනය අසාර්ථක වී පැවතුණි. | විගණන ඡේදයේ සඳහන් පරිදි වාහන අළුත්වැඩියාවන් සිදුකිරීමේදි බාහිර ආයතන සඳහා තත්ව පරික්ෂණය (facility audit) සිදුකරනු ලබන අතර මෙහිදී සිදුකරනු ලැබූ තත්ව පරික්ෂණයෙන් Tech Net Auto World (Pvt) Ltd ආයතනයද තෝරාගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ හා පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව ක්‍රියා කල යුතු වීම. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි යන්ත්‍ර ප්‍රවාහන අළුත්වැඩියා කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ පක්ෂාංගය වෙත 2011 ජූනි 23 සිට අළුත්වැඩියාවන් වෙනුවෙන් ලැබී තිබූ වාහන 105 ක් නිසි සැලසුමකින් යුක්තව අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 12 ක කාලයක් නිෂ්කාර්යව ඌණ උපයෝජිතව පැවතුණි. | වාහන 105න් 31ක් සඳහා පිරිවැය අධික වීම හේතුවෙන් අපහරණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඉතිරි වාහන 74 සඳහා වාහන ප්‍රතිස්ථාපනය සඳහා කාර්තු (Recovery plan) ලෙස සැලසුම් සකස් කරමින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කර වාහන උපයෝජනයට ගත යුතු වීම. |
| (ආ) | කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි සැපයුම් හා නඩත්තු පක්ෂාංගය තුල පවතින ගබඩා සඳහා ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේදී රු.1,346,000 ක් සහ 2023 වර්ෂයේදී රු.3,841,860 ක් ලෙස එකතුව රු.5,187,860 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2024 පෙබරවාරි 09 දින වන විටත් අදාළ ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත නොවීම හේතුවෙන් අවදානමක් පැවති අතර එම භාණ්ඩ ගබඩා තුල නිෂ්කාර්යව පැවතුණි. | අදියරයන් කිහිපයක් ඔස්සේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු වන බැවින් මිළට ගත් භාණ්ඩ යොදාගෙන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ඉතිරි ප්‍රතිපාදන ලැබිය යුතු අතර ව්‍යාපෘතිය නිම කිරීම 2024 තුළදී කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. | භාණ්ඩ නිෂ්කාර්යව පැවතීම නොවිය යුතුවීම. |
| (ඇ) | කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගබඩා අංශ 06 ක් තුල සෙමින් නිකුත් වන රු.5,574,656 ක් වටිනා භාණ්ඩ අයිතම 22,061 ක්, නිකුත් නොවී ගබඩා තුල පවතින රු.2,763,655 ක් වටිනා භාණ්ඩ අයිතම 12,946 ක් සහ අපහරණ මණ්ඩලය වෙත යොමු කරන ලද රු.840,570 ක් වටිනා භාණ්ඩ අයිතම 633 ක් 2024 පෙබරවාරි 09 දිනට ගබඩා තුල පැවතුණි. | සෙමින් නිකුත් වන භාණ්ඩ අයිතම ගුවන් හමුදා මූලස්ථානය මඟින් ලබාදෙන අනුමැතීන්ට අදාළව ගබඩාවෙන් නිකුත් කිරීම් සිදුකරන අතර නිකුත් නොවී පවතින භාණ්ඩ අයිතම පිළිබඳ තොරතුරු 2023 තොග සත්‍යාපන මණ්ඩල නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ අපහරණ මණ්ඩල වෙත යොමු කර ඇති භාණ්ඩ අයිතම සම්බන්ධව අපහරණ මණ්ඩල නිර්දේශයන් අනුව කටයුතු කරනු ලැබේ. | ගබඩා පාලනය යටතේ භාණ්ඩ වෙනුවෙන් දරණ ලද වැය ඌණ උපයෝජිත නොවන සේ පවත්වාගෙන යා යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අළුත්වැඩියාවන් සඳහා විදේශයන් වෙත යවන ලද අළුත්වැඩියා වටිනාකම ඇ.ඩො. 191,289.22 ක් වූ ගුවන් යානා අමතර කොටස් 27 ක් හා අගයන් වාර්තා නොවූ එහි සුන්බුන් අගය එකතුව ඇ.ඩො 63,000 ක් වූ ගුවන් යානා අමතර කොටස් 32 ක් විදේශයන් වෙත යවා වර්ෂ 09 -19 ත් අතර කාලයක් ගතවී තිබුණද 2024 පෙබරවාරි 09 දින වන විටත් ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි. | 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලද ගුවන් යානා අමතර කොටස් අයිතම ගණන එකකි. මෙම තවදුරටත් ලැබිය යුතු අයිතම 33 ක් අපහරණ මණ්ඩල වෙත ද එක් අයිතමයක් පරීක්ෂණ අධිකරණයක් වෙත ද යොමු කිරීමට අපේක්ෂිතයි. ඉතිරි අයිතම 14 ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී | පරීක්ෂණ අධිකරණ කටයුතු,ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමේ කටයුතු කඩිනමින් අවසන් කලයුතු වීම. |
| (ඉ) | කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් යානා අමතර කොටස් පක්ෂාංගයේ 2020 වර්ෂයේ සිට 2024 පෙබරවාරි 09 දිනය දක්වා විදේශයන් වෙතින් නව මිලදී ගැනීම් හා අළුත්වැඩියාවන් අවසන් වීම් ලෙස ගෙන්වා ගෙන තිබූ ගුවන් යානා අමතර කොටස් 63 ක් විවිධ ගැටළු හේතුවෙන් අදාල පක්ශාංගය වෙත නිකුත් නොකර වර්ෂ 1-4 අතර කාල ප්‍රමාදයකින් නිරෝධායනයන් (Quarantined Items) ලෙස රඳවාගෙන තිබුණි. ඒ අනුව එහි නිශ්චිත වටිනාකම සඳහන් අවස්ථා 09 ක් යටතේ මිලදීගෙන තිබූ වටිනාකම යූරෝ 21,218.86 ක් හා ඇ.ඩො.50,141 ක වටිනාකමකින් යුතු ගුවන් යානා අමතර කොටස් හා 2020 සිට 2023 දක්වා කාල සීමාව තුලදී අළුත්වැඩියාව අවසන් කරන ලද අවස්ථා 16 කට අදාලව එකතුව ඇ.ඩො. 527,550 ක් වූ ඉතා අධික වටිනාකමෙන් යුතු ගුවන් යානා අමතර කොටස් නිෂ්කාර්යව ගබඩාව තුල පැවතුණි. | 2020 සිට 2024 කාලය තුළ විදේශයන් වෙතින් නව මිලදී ගැනීම් හා අළුත්වැඩියාවන් අවසන් වී ගෙන්වා තිබූ ගුවන් යානා අමතර කොටස් විවිධ ගැටලු හේතුවෙන් පක්ෂාංගය වෙත නිකුත් නොකර නිරෝධායන ගබඩාව (Quarantined stores) තුළ පවතී. | මිලදී ගනු ලබන ගුවන් යානා අමතර කොටස් ගබඩාව තුල නිෂ්කාර්යව රඳවා නොගෙන ඉහල කාර්යක්ෂමතාවකින් යුතුව උපයෝජනය කළයුතු වීම. |
| (ඊ) | ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම යටතේ අවස්ථා 09 ක දී රේගු ගාස්තු ලෙස රු.65,752,943 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මේ වැයකර තිබූ නමුත් එම ගුවන් යානා අමතර කොටස් මුළුමණින්ම හෝ ඇණවුමේ කොටසක් වශයෙන් Quarantined Items ලෙස රඳවා තබා ගැනීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරණ ලද මෙම වියදම වර්ෂ 01ත් 4ත් අතර කාලයක් නිෂ්කාර්ය වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මිලදී ගනු ලබන ගුවන් යානා අමතර කොටස් ගබඩාව තුල නිෂ්කාර්යව රඳවා නොගෙන උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කළයුතු වීම. |

**3.3 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ ඇමුණුම (ii) පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් අවස්ථා 10 කට අදාලව එකතු වටිනාකම රු.9,740,136 ක් වූ පාඩු හා අත්හැරීම් වෙනුවෙන් මු.රෙ.109 යටතේ අලාභයන් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී තිබුණු නමුත් අදාළ අනුමැතිය ලැබී මාස 1-13 ත් අතර කාලයක් ගත වී පැවතියදීත් එම පාඩු සහ අත්හැරීම් පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | හානි හා පාඩු මු.රෙ 109 යටතේ අලාභයන් කපා හැරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් හා ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පොත් වලින් කපාහැරීමේ කටයුතු සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත. | අනුමැතිය ලද අලාභයන් කපා හැරීම් පාඩු සහ අත්හැරීම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කපා නොහළ ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් ශේෂය රු.577,625,996 ක් වුවද, සමාලෝචිත 2023 ජනවාරි 01 දිනට ආරම්භක කපා නොහළ ශේෂය ලෙස රු.595,362,729 ක් වීම නිසා රු.17,736,733 ක ආරම්භක ශේෂ වෙනසක් පැවතුණි. | මූලික ඇස්තමේන්තුව සංශෝධනය වී ඇත.තවද සිද්ධීන් 08 ක් සම්බන්ධයෙන් වන හානි ඇතුළත් වී නොතිබීම. | ආරම්භක ශේෂ වෙනස්කම් සඳහා හේතු දැක්විය යුතු වීම. |
| (ඇ) | ගුවන් 3878 දරණ වාහනයේ සිදු වූ අනතුරට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු1,508,440 ක ශේෂය මුදල් රෙගුලාසි 109 ප්‍රකාර ඇමුණුම (ii) යටතේ වන පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම් ප්‍රකාශනයෙන් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි.එසේම 2023 දෙසැම්බර් 31 දිනට පාඩු හා අත්හැරීම් වලට අදාළව වගකිව යුතු පාර්ශව වෙතින් වැටුපෙන් අයකර තිබූ පාඩු හා අත්හැරීම් සිදුවීම් 19 කට අදාලව එකතු වටිනාකම රු.3,014,342 ක් මුදල් රෙගුලාසි 109 ප්‍රකාර ඇමුණුම | තොරතුරු අතපසු වීමක් හේතුවෙන්, වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයවිය යුතු වටිනාකම් අයකර ගනිමින් පැවතීම හේතුවෙන් අදාළ අයකර ගැනීමේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර නොමැත | මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි තොරතුරු ඇතුළත් කළයුතු වීම. |

(ii) යටතේ පොතෙන් කපා හැරීම් හා අය කිරීම් පිළිබඳ ප්‍රකාශනයේ අයකර ගැනීම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

**3.4 අනාර්ථික ගණුදෙනු**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් බැටරි නැවත ආරෝපණය කිරීම හා බැටරිය විශ්ලේෂණය කිරීම අරමුණින් බැටරි විශ්ලේෂක (Battery analyzer) 17 ක් හා ඊට අදාල adapter 108 ක් ඇ.ඩො. 105,717 වටිනාකමට ආයතනයෙන් 2022 මාර්තු 25 දින මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 ප්‍රකාර පිරිවැය ඇස්තමේන්තු උද්ධමනය වැනි සාධක හමුවේ වෙනස් වීම් වලට අදාලව පිරිවැය සංශෝධිතය අදාළ අධිකාරිත්වය අනුමත කළ යුතු වුවත් එයින් බැහැර වී තිබුණි.ඒ අනුව අධිකාරිත්වය විසින් අනුමත කල මුළු පිරිවැය 2021 නොවැම්බර් 26 දින වන විට රු.24,863,776 ක් වුවත් තත්‍ය වශයෙන්ම රු.35,609,286 ක් වූ වියදමක් ඒ වෙනුවෙන් දරා තිබුණි. | විදේශීය මිලදී ගැනීමක් වන අතර ඇමරිකානු ඩොලරයේ අගය වැඩි වීම නිසා 2022 අප්‍රේල් 18 වන දින රු. 35,609,286.00 වැය කර ඇත. | ප්‍රසම්පාදන අගයන්ගේ වෙනස් වීම් වලට අදාළ අධිකාරියේ බලය ලබා ගත යුතු බව. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ප්‍රකාර සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේදී තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගන්නා විභව සැපයුම්කරුවන්ගේ ලංසු කැඳවිය යුතුය.යථොක්ත ප්‍රසම්පාදනයට අදාළ ඒකක මිල ගණන් අන්තර්ජාලයෙන් ඒවා මිලදී ගත් ආයතනයේ වෙබ් පිටුවේ ඇ.ඩො.2630 ක් ලෙස මිල ප්‍රදර්ශණය වුවත් ප්‍රසම්පාදනය පැවරුමට අදාල එම ආයතනයෙන් ඒකක මිල ඇ.ඩො.5090 ක් වූ ඉතා අධික මිලක් විය. ඒ අනුව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් මෙම ප්‍රසම්පාදනය සිදු නොකිරීම නිසාවෙන් එකතුව රු.14,051,520 කට ආසන්න මුදලක් රජයට අවාසිදායක වන අයුරින් වැය කර තිබුණි. | අන්තර්ජාලයේ මිල ගණන් සඳහන් භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය තාක්ෂණික පිරිවිතරයන් සහ දත්තයන් ටෙන්ඩර් පටිපාටිය තුළින් ණය පදනම යටතේ මිලදී ගන්නා භාණ්ඩ හා සැසඳීමේ දී වෙනස් විය හැක. | වෙළඳපල මිල පිළිබඳව පරීක්ෂා කිරීමෙන් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ යුතු බව. |
| (ඇ) බැටරි විශ්ලේෂණය හා Adapter සඳහා ඇ.ඩො.105,717 (රු.35,520,912 ක්) වූ අධික වැයක් දරා තිබූ නමුත් ඒවා උපයෝජනයට අදාළ ගුවන් හමුදාව සතු භාවිතා කරනු ලබන වෝර්කි ටෝර්කි ප්‍රමාණය 2594 ක් ද බැටරි ගණන 3282 ක් ද විය. නව බැටරි මිලදී ගත්තද ඒකකයක සාමාන්‍ය ඒකක පිරිවැය රු.5000 කට අඩු අගයක්ව පැවතුණි.ඒ අනුව මිලදී ගැනීමේ අවශ්‍යතාවය ප්‍රමුඛගත කිරීමේදී ඉතාම සුළු වටිනාකමකින් යුතු බැටරි විශ්ලේෂණය කිරීම සඳහා රු.35,520,912 ක පිරිවැයක් දරා තිබීම විගණනයේදී අනාර්ථික ගණුදෙනුවක් බව නිරීක්ෂණය විය. | දීර්ඝ කාලීනව බැටරි සංරක්ෂණය කිරීම මෙන්ම බැටරි නව මිලදී ගැනීමකට නොයැම මේ සඳහා අරමුණු කරගෙන ඇත. | වියදම් අනාර්ථික නොවිය යුතුය. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුකුරුන්ද කඳවුර තුළ 2001 වර්ෂයේ සිට ගිවිසුම් රහිතව ගුවන් මෙහෙයුම් කටයුතු සිදු කල Asian Aviation පුද්ගලික සමාගම 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා රු.420,453 ක් වූ හිඟ මුදල් ගෙවීම් නොකර 2021 මාර්තු 18 දින කඳවුරෙන් ඉවත්ව තිබුණි. ඒ අනුව ගිවිසුම් රහිතව කටයුතු කිරීම හේතුවෙන් අයවිය යුතු මුදල් අයකල නොහැකි වී තිබුණි. | අදාළ සමාගම ලිඛිත ගිවිසුමක් නොමැතිව පරිශ්‍රයේ රැඳී සිටින බවට නීති අධ්‍යක්ෂකය දැනුවත් වූ ඔවුන්ව ඉවත් කිරීමට කටයුතු කරන ලද අතර හිඟ මුදලට අදාළව පැවති පරීක්ෂණ අධිකරණය මගින් එම මුදලින් රු.350,000 ක් අඩු කර රු. 70,453.60 ක් පමණක් අය විය යුතු බවට තීරණය කර ඇත. එම රු.70,453.60 ගෙවන ලෙසට අදාළ සමාගමට එන්තර වාසියක් යවා ඇත. | නීත්‍යානුකූලව ඇතිකරගත යුතු වීම හා ගිවිසුම් ප්‍රකාර කටයුතු කළ යුතු වීම. |